# ශ්‍රී ලංකා සෞභාග්‍යය දර්ශකය - 2018

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සියලුම පළාත්බද සෞභාග්‍යතා දර්ශකවල වැඩිදියුණු වීමත් සමඟ 2018 වසරේ දී ශ්‍රී ලංකාවේ සෞභාග්‍යතා දර්ශකය ඉහළ යන ලදී.**


## ජාතික සෞභාග්‍යය

2018 වසරේ ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය[1], 2017 වසරේ දී වාර්තා කළ 0.548 සිට 0.783 දක්වා ඉහළ යන ලදී. මෙම වැඩිදියුණු වීම සඳහා 'ආර්ථික සහ ව්‍යාපාර පරිසරය', 'ජන ජීවිතයේ යහපැවැත්ම' සහ 'සමාජ-ආර්ථික යටිතල පහසුකම්' යන උපදර්ශක තුනම දායක වී ඇත.

| | 2017 | 2018 |
|---|---|---|
| ***ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය*** | ***0.548*** | ***0.783*** |
| *උපදර්ශක* | | |
| *ආර්ථික සහ ව්‍යාපාර පරිසරය* | 0.658 | 1.034 |
| *ජන ජීවිතයේ යහපැවැත්ම* | 0.532 | 0.764 |
| *සමාජ-ආර්ථික යටිතල පහසුකම්* | 0.454 | 0.550 |

2018 වසර තුළ දී ආර්ථික සහ ව්‍යාපාර පරිසරය උපදර්ශකය වර්ධනය වීම සඳහා මිල ස්ථායීතාව සහ අවිධිමත් අංශයේ වැටුප් ඉහළ යෑම හේතු විය. ජන ජීවිතයේ යහපැවැත්ම උපදර්ශකයට අදාළව සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපන පහසුකම්වල ගුණාත්මකභාවය, මහජනතාවගේ වත්කම්, පරිසරයේ පිරිසිදුකම යන අංශවල ඉහළ වර්ධනයන් වර්තා විය. 2018 වසර තුළ දී සමාජ-ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකයේ වැඩිවීම කෙරෙහි විදුලිබල, ප්‍රවාහන සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යන පහසුකම් පැවතීම සහ නලජලයේ ගුණාත්මකභාවය වැඩිදියුණු වීම ප්‍රධාන වශයෙන් දායක විය.

**රූප සටහන 1 - ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකයෙහි සහ එහි උපදර්ශකවල විචලනයන්: 2014 – 2018**




**මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව**

**රූප සටහන 2 – සෞභාග්‍යතා දර්ශකය මඟින් ආවරණය වන අංශ**





**මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව**

[1] ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය (Sri Lanka Prosperity Index – SLPI) යනු රටෙහි සෞභාග්‍යය මැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් සම්පාදනය කරනු ලබන බහුමාන දර්ශකයකි. මෙම දර්ශකය, සෞභාග්‍යය මනිනු ලබන විවිධ අංශ නියෝජනය කරන විචල්‍යයන් 43ක් යොදා ගනිමින් ගණනය කරනු ලබන ආර්ථික සහ ව්‍යාපාර පරිසරය, ජන ජීවිතයේ යහපැවැත්ම සහ සමාජ-ආර්ථික යටිතල පහසුකම් යන උපදර්ශක තුනකින් සමන්විත වේ.

## පළාත්බද සෞභාග්‍යය

පළාත් මට්ටමින් සෞභාග්‍යය මැනීම සඳහා සම්පාදනය කරනු ලබන පළාත්බද සෞභාග්‍යතා දර්ශක පළාත් නවයෙහිම වර්ධනය වී ඇති බව වාර්තා විය. බස්නාහිර පළාත, පළාත්බද සෞභාග්‍යතා දර්ශකයෙහි සහ එහි උප දර්ශකවල ඉහළම අගයන් වාර්තා කරන ලදී. මේ අතර, පළාත්බද සෞභාග්‍යය දර්ශකයෙහි ඉහළම වර්ධනය සබරගමුව පළාතෙන් වාර්තා වූ අතර මිල ස්ථායීතාව සහ අවිධිමත් අංශයේ වැටුප් ඉහළ යෑම නිසා සිදු වූ ආර්ථික සහ ව්‍යාපාර පරිසරය උපදර්ශකයේ වැඩිදියුණු වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

රූප සටහන 2 - පළාත්බද සෞභාග්‍යතා දර්ශකය[2]: 2017- 2018




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## පළාත්බද සෞභාග්‍යයන්හි කාර්ය සාධනය

### ආර්ථික සහ ව්‍යාපාර පරිසරය උපදර්ශකය

සියළුම පළාත්වල ආර්ථික සහ ව්‍යාපාර පරිසරය උපදර්ශකය ඉහළ ගිය අතර, මිල ස්ථායීතාවයේ සහ අවිධිමත් අංශයේ වැටුප්වල වාර්තා වූ ඉහළ යෑම් මීට හේතු විය. මෙම උපදර්ශකය තුළ ඉහළම වැඩිවීම උතුරු පළාතෙන් වාර්තා වූ අතර, ඒ සඳහා ඉහත  සඳහන් කළ සාධකවලට අමතරව සේවා නියුක්තියට අදාළ අංශවල වර්ධනයද හේතු විය.

### ජන ජීවිතයේ යහපැවැත්ම උපදර්ශකය

ජන ජීවිතයේ යහපැවැත්ම උපදර්ශකයේ ඉහළ යෑම් සියළුම පළාත්වලින් වාර්තා වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් අධ්‍යාපන පහසුකම්වල ගුණාත්මකභාවය, පරිසරයේ පිරිසිදුකම සහ ජනතාවගේ වත්කම් ඉහළ යෑම් මනිනු ලබන වාහන හිමිකාරීත්වය හා සුපිරි වෙළඳසැල් සඳහා වන ප්‍රවේශය යන සාධකවල වැඩිවීම හේතු විය. මෙම උපදර්ශකය තුළ ඉහළම වැඩිවීම සබරගමුව පළාතෙන් වාර්තා වුවද, අනෙක් සියලුම පළාත්වල ඉහළ යෑමක් වාර්තා කළ වාහන හිමිකාරීත්වයෙහි යම් පහළ යාමක් සබරගමුව පළාත තුළින් දක්නට ලැබුණි.

### සමාජ-ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය

පළාත් අටක සමාජ-ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකයේ ඉහළ යෑමක් වාර්තා විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විදුලිබල හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පහසුකම්වල සිදු වූ වර්ධනයන්ය. මෙම උපදර්ශකය තුළ ඉහළම වැඩිවීම බස්නාහිර පළාතෙන් වාර්තා වූ අතර, ඒ සඳහා ඉහත සාධක වලට අමතරව මාර්ග සංවර්ධනය, ප්‍රවාහන පහසුකම්, අපරාධවලින් තොර පරිසරයක්  පැවතීම සහ නළජලයේ ගුණාත්මකභාවය යනාදියෙහි වැඩි දියුණු වීම් දායක විය. මේ අතර, නැගෙනහිර පළාතේ උපදර්ශකය පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විදුලි සංදේශ පහසුකම්, මාර්ග සංවර්ධනය, අපරාධවලින් තොර පරිසරයක්  පැවතීම සහ ප්‍රජා ක්‍රියාකාරකම් සඳහා කාන්තා සහභාගීත්වය යනාදියෙහි අඩුවීමයි.

[2] දර්ශක අගයන් ගණනය කිරීමේ දී සියලුම විචල්‍යයන් ඒවායේ පසුගිය වසර 10 හි දත්ත යොදා ගනිමින් සම්මතකරණය කරනු ලබයි. එම නිසා දර්ශක අගයේ සලකුණ මගින් අදාළ මධ්‍යන්‍යයට සාපේක්ෂව එහි ධන හෝ ඍණ වෙනස්වීම පිළිබිඹු කරන අතර දර්ශකයේ ඍණ අගයන් මගින් සෞභාග්‍යතාව ඍණ මට්ටමක පවතී යැයි පිළිබිඹු නොවේ.

**සංඛ්‍යා සටහන 1 - පළාත්බද සෞභාග්‍යතා දර්ශක, උපදර්ශක සහ පළාත්බද ශ්‍රේණි**

| දර්ශක අගය සහ පළාත | දර්ශක අගය | | පළාත්බද ශ්‍රේණිය | |
|---|---|---|---|---|
| | 2017 | 2018 | 2017 | 2018 |
| **පළාත්බද සෞභාග්‍යතා දර්ශකය** | | | | |
| මධ්‍යම | 0.272 | 0.490 | 3 | 2 |
| නැගෙනහිර | -0.046 | 0.168 | 9 | 9 |
| උතුරු මැද | 0.062 | 0.256 | 6 | 7 |
| වයඹ | 0.227 | 0.456 | 4 | 4 |
| උතුර | 0.099 | 0.399 | 5 | 5 |
| සබරගමුව | 0.025 | 0.341 | 8 | 6 |
| දකුණු | 0.309 | 0.470 | 2 | 3 |
| ඌව | 0.057 | 0.201 | 7 | 8 |
| බස්නාහිර | 1.071 | 1.301 | 1 | 1 |
| **ආර්ථික සහ ව්‍යාපාර පරිසරය උපදර්ශකය** | | | | |
| මධ්‍යම | 0.283 | 0.586 | 3 | 4 |
| නැගෙනහිර | -0.198 | 0.302 | 9 | 9 |
| උතුරු මැද | 0.091 | 0.495 | 7 | 6 |
| වයඹ | 0.198 | 0.672 | 4 | 3 |
| උතුර | -0.170 | 0.473 | 8 | 7 |
| සබරගමුව | 0.117 | 0.568 | 5 | 5 |
| දකුණු | 0.332 | 0.680 | 2 | 2 |
| ඌව | 0.105 | 0.345 | 6 | 8 |
| බස්නාහිර | 1.524 | 1.734 | 1 | 1 |
| **ජන ජීවිතයේ යහපැවැත්ම උපදර්ශකය** | | | | |
| මධ්‍යම | 0.118 | 0.274 | 7 | 7 |
| නැගෙනහිර | -0.078 | 0.075 | 9 | 9 |
| උතුරු මැද | 0.148 | 0.318 | 6 | 6 |
| වයඹ | 0.244 | 0.390 | 4 | 5 |
| උතුර | 0.300 | 0.397 | 3 | 4 |
| සබරගමුව | 0.162 | 0.406 | 5 | 3 |
| දකුණු | 0.469 | 0.552 | 2 | 2 |
| ඌව | -0.001 | 0.078 | 8 | 8 |
| බස්නාහිර | 0.903 | 1.125 | 1 | 1 |
| **සමාජ-ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය** | | | | |
| මධ්‍යම | 0.416 | 0.610 | 2 | 2 |
| නැගෙනහිර | 0.139 | 0.127 | 5 | 7 |
| උතුරු මැද | -0.052 | -0.044 | 8 | 9 |
| වයඹ | 0.239 | 0.305 | 3 | 4 |
| උතුර | 0.168 | 0.328 | 4 | 3 |
| සබරගමුව | -0.205 | 0.050 | 9 | 8 |
| දකුණු | 0.126 | 0.179 | 6 | 6 |
| ඌව | 0.066 | 0.179 | 7 | 5 |
| බස්නාහිර | 0.787 | 1.043 | 1 | 1 |

**මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව**

## තාක්ෂණික සටහන:

### සෞභාග්‍යතා දර්ශකය

උපදර්ශක 3 ක් යටතේ වර්ගීකරණය කරන ලද විචල්‍යයන් 43 ක් යොදා ගනිමින් සෞභාග්‍යතා දර්ශකය සම්පාදනය කරනු ලබන අතර ප්‍රධාන දර්ශකය තුළ සියලුම උපදර්ශක සඳහා සමාන බර තැබීම් ද, උපදර්ශක තුළ ඊට අදාළ සෑම විචල්‍යයක් සඳහා සමාන බර තැබීම් ද ලබා දී තිබේ.

ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකය මිල ස්ථායීතාව, ජීවන තත්ත්වය, ආදායම, දරිද්‍රතාවය, සේවා නියුක්තිය, කර්මාන්තශාලා ඝනත්වය සහ බැංකු ශාඛා ඝනත්වය ලෙස වර්ග කරනු ලැබූ විචල්‍යයන් 9 ක් භාවිතා කරමින් සම්පාදනය කරනු ලැබේ. ජන ජීවිතයේ යහපැවැත්ම පිළිබඳ උපදර්ශකය ගණනය කිරීමේ දී, සෞඛ්‍ය පහසුකම් පැවතීම, අධ්‍යාපන පහසුකම් පැවතීම හා එහි ගුණාත්මකභාවය, වත්කම්, විනෝද කටයුතු සඳහා වූ පහසුකම් පැවතීම හා එහි භාවිතය, වායුගෝලයේ ගුණාත්මකභාවය සහ පරිසරයේ පිරිසිදු බව යන අංශයන්ට අදාළව විචල්‍යයන් 22 ක් භාවිතා කරනු ලැබේ. සමාජ-ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය විචල්‍යයන් 12 කින් සමන්විත වන අතර, එමගින් ප්‍රවාහන පහසුකම් පැවතීම, මහා මාර්ග පහසුකම් පැවතීම, විදුලි සංදේශ පහසුකම් පැවතීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පහසුකම් පැවතීම, විදුලිබල පහසුකම් පැවතීම, ආරක්ෂිත පානීය ජල පහසුකම් පැවතීම, නලජලයේ ගුණාත්මකභාවය, සහ සනීපාරක්ෂක පහසුකම් පැවතීම සහ අපරාධවලින් තොර පරිසරයක් පැවතීම, යන පැතිකඩ ආවරණය වේ.

### ක්‍රමවේදය

ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය සම්පාදනයේදී යොදා ගන්නා විචල්‍යයන් විවිධ මිනුම් ඒකක මගින් ගණනය කරනු ලබයි. එම නිසා සියලුම විචල්‍යයන්ගේ පසුගිය වසර 10 හි දත්ත, සම්මතකරණය මගින් පොදු පරිමාණයකට සකසා ගනු ලැබේ. සමස්ත රටෙහි හා පළාත්වල දර්ශක වෙන් වෙන් වශයෙන් සම්පාදනය කර ඇති බැවින් පළාත් දර්ශක, සමස්ත රටෙහි දර්ශක සමඟ සංසන්දනය කළ නොහැක. ඒ අනුව, පළාත් මට්ටමේ දර්ශක, පළාත් එකිනෙක අතර හා කාලය සමඟ සංසන්දනය කළ හැකි අතර සමස්ත රටෙහි දර්ශකය කාලය සමඟ පමණක් සංසන්දනය කළ හැක.